සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

29 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. රූපවාහිනී මාධ්‍යයෙන් විකාශනය වන ''ජාතික පාසල'' ''තක්සලාව'' ''ගොවිබිමක අරුණළු'' ''අපේ ගණිත පන්තිය'' වැනි වැඩසටහන් ඉදිරිපත් කිරීම තුළින් ඉටු කරනු ලබන සන්නිවේදන කාර්යය වන්නේ,
    1. මතවාදී කාර්යය යි.
    2. විනෝදාස්වාද සම්පාදනය යි.
    3. සංස්කෘතික ප්‍රගමනය හා හුවමාරුව යි.
    4. අධ්‍යාපන කාර්යයයි.
    5. සමාජ සංවිධානමය කාර්යය යි.

02. සියලු බහුජන මාධ්‍ය වලට පොදු සමානකම වනුයේ,
    1. උදාසීන මාධ්‍ය ලෙස ක්‍රියාත්මක වීමයි.
    2. ව්‍යක්ත ලෙස භාෂාව යොදා ගැනීමයි.
    3. ග්‍රාහකයා තුළ පරිකල්පනය ඇති කිරීමයි.
    4. ග්‍රාහකයා වෙත සංදේශයක් ඉදිරිපත් කිරීමයි.
    5. විචාරය සඳහා යොදාගත යුතු ශිල්පීය ක්‍රම සමාන වීමයි.

03. මහජන සම්බන්ධතාවය සඳහා වඩා හිතකර වූ නැඹුරුතාවයක් රාජ්‍ය ආයතනවලට වඩා පෞද්ගලික ආයතන විසින් දක්වනු ලබන්නේ,
    1. රාජ්‍ය ආයතනවලට වඩා පෞද්ගලික ආයතන කාර්යක්ෂම නිසා ය.
    2. මහජනයාට උපරිම සේවයක් ඉටුකිරීම පෞද්ගලික අංශයේ තේමාව වන නිසා ය.
    3. රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික අංශයේ සේවා මහජනයාට ප්‍රයෝජනවත් නිසා ය.
    4. රාජ්‍ය අංශයට ප්‍රවර්ධන කටයුතු අත්‍යවශ්‍ය නොවන නිසා ය.
    5. පෞද්ගලික අංශය තම ප්‍රවර්ධන කටයුතුවලින් ඉලක්ක සපුරා ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරන නිසා ය .

04. ස්ව - සංකල්පය,

    A - ඇගයීමකට ලක් කළ හැකිය.
    B - සංවර්ධනය කරගත හැකිය.
    C - ක්ෂණයක් පාසා වෙනස්වීමට ලක්වෙයි.
    D - අන්තර් පුද්ගල සන්නිවේදනය පහසු කරයි.
    E - සාපේක්ෂ වශයෙන් ස්ථිර සංජානනයකි.

    ඉහත ලක්ෂණ අතුරින් සත්‍ය වනුයේ,
    1. A,B සහ E පමණකි.
    2. A,C,D සහ E පමණකි.
    3. C සහ D පමණකි.
    4. A,B,C,D සහ E සියල්ල වේ.
    5. ඉහත කිසිවක් සත්‍ය නොවේ.

05. සමාජයේ සෑම කොටසක් තුළ ම සමාජවාදී විඥානය පෝෂණය කරමින් සංවර්ධනය සඳහා ප්‍රවේශවීමට උපක්‍රම සැළසුම් කරන ලද්දේ,
    1. ඉන්දියාව යි.
    2. සෝවියට් රුසියාව යි.
    3. මහජන චීනය යි.
    4. ශ්‍රී ලංකාවයි.
    5. ජපානයයි.

06. ආත්මාවබෝධය, නිර්මාණශීලි චින්තනය, චිත්තවේග හා ප්‍රතිචාර, ආත්මාවර්ජනය යනාදී ක්‍රියාකාරකම් අයත් වන්නේ,
   1. නව මාධ්‍යයට ය.
   2. පුද්ගලාන්තර සන්නිවේදනයට ය.
   3. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට ය.
   4. ජනමාධ්‍ය පරිහරණය තුළ ය.
   5. සමූහ සන්නිවේදනය තුළ ය.

07. නිර්බහුජනීය විඥාපන මාධ්‍ය යනු,
   1. ලෝකයටම පොදු වූ දැනුම යි.
   2. ලෝකයටම පොදු වූ විශ්ව ව්‍යාප්ත ජනමාධ්‍ය හරහා තොරතුරු ලබාගැනීමේ ක්‍රියාවලියයි.
   3. ලෝකයා විසින් බෙදා හදාගනු ලබන විශ්වාසයන් සමූහයකි.
   4. ගෝලීයකරණය තුළින් අත්පත්වන ප්‍රවණතාවයකි.
   5. සංවර්ධිත රටවලට පමණක් සීමා වූ සහ ඔවුනොවුන් හුවමාරු කරගන්නා දැනුමයි.

08. රජයේ ප්‍රකාශන නිකුත් කිරීම හා රාජ්‍ය ප්‍රකාශන අලෙවිය,
   1. රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව සතු කාර්යයකි.
   2. පාර්ලිමේන්තුව සතු කාර්යයකි.
   3. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අරමුණකි.
   4. විදුලි සංදේශ සේවා නියාමන කොමිෂන් සභාවේ අරමුණකි.
   5. රාජ්‍ය පරිපාලන ආමාත්‍යංශයේ කාර්යභාරයකි.


09. භාෂාවේ වචනවලට නව අර්ථ එකතු වීම,
   1. සම්මත භාෂාවේ ලක්ෂණයකි.
   2. භාෂාවේ පරිණාමය තුළින් ඇතිවන තත්ත්වයකි.
   3. උප භාෂාවල බලපෑමකි.
   4. ජීව භාෂා ප්‍රවණතාවයකි.
   5. අසම්මත භාෂාවක පවතින තත්ත්වයකි.

10. රටක සිදුවන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් තුළින් විනාශවන මිනිස් ජීවිත හා පොදු දේපල පිළිබඳ නිවැරදි තොරතුරු හා සංඛ්‍යා ලේඛන රජය හා ජන මාධ්‍ය තුළින් ලබා නොදෙන තත්ත්වයක් දක්නට ලැබේ නම් එයින් ගම්‍ය වන්නේ,
   1. නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පයේ ක්‍රියාකාරිත්වයයි.
   2. සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පයේ ක්‍රියාකාරිත්වයයි.
   3. සෝවියට් සමාජවාදී සන්නිවේදන සංකල්පයේ ක්‍රියාකාරිත්වයයි.
   4. ප්‍රජාතාන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පයේ ක්‍රියාකාරිත්වයයි.
   5. අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේ ක්‍රියාකාරිත්වයයි.

11. සංවර්ධනය ඇති කිරීමේ දී ජනමාධ්‍යයේ කාර්යයක් ලෙස ''ජාතික න්‍යාය පත්‍රය සැකසීම'' හඳුන්වාදෙන ලද්දේ,
   1. එවරට්.එම්. රොජර්ස් ය.
   2. මහාචාර්ය විල්බර් ශ්‍රාම් ය.
   3. ඩඩ්ලි සියර්ස් ය.
   4. පෝල්. පී. ස්ටීවන් ය.
   5. මහාචාර්ය විමල් දිසානායක ය.

12. ජන මාධ්‍ය හා නව මාධ්‍ය විසින් ව්‍යාපාරිකයන් හා පාරිභෝගික ප්‍රජාව අතර බන්ධනයක් ඇති කරනු ලබන්නේ,
   1. ටෙලි නාට්‍ය කලාව හරහා ය.
   2. විදේශීය සිනමාව හා පරිවර්තිත ටෙලිනාට්‍ය හරහා ය.
   3. මාධ්‍ය දැන්වීම්කරණය හා අනුග්‍රාහකත්වය හරහා ය.
   4. මාධ්‍ය සාකච්ඡා හා දේශපාලන වැඩසටහන් හරහා ය.
   5. යථාකාරී (Reyality) වැඩසටහන් හරහා ය.

13. රූපසටහනට අනුව සංවර්ධන සංදේශනයේ දී "D" කණ්ඩායම යනු,



   1. වෙනස්වීම මනාව පිළිගන්නා කණ්ඩායමයි.
   2. ප්‍රමාදිත බහුජනතාවයි.
   3. වෙනස්කම් දෙස බලා ඉක්මනින් එකතුවන කණ්ඩායමයි.
   4. ප්‍රමුඛ බහුජනතාවයි.
   5. නවීකරණය සඳහා කෙසේවත් එකතු නොවන කණ්ඩායමයි.

14. මිනිස් හඬ, සංගීතය, පාරිසරික ශබ්ද ආදිය භාවිතයෙන් සන්නිවේදන කාර්යය සිදු කිරීම,
1. රූපවාහිනී මාධ්‍ය රීතිය යි. 2. පුවත්පත් මාධ්‍ය රීතිය යි. 3. නව මාධ්‍ය රීතිය යි.
4. ගුවන් විදුලි මාධ්‍ය රීතිය යි. 5. චලන මාධ්‍ය රීතිය යි.


15. මාධ්‍ය විචාරයේ මූලිකාංග අතරට අයත් නොවන්නේ,
1. මාධ්‍යකරුවන් ය. 2. මාධ්‍ය නිර්මාණය 3. ග්‍රාහකයා ය.
4. විචාරකයා ය. 5. මාධ්‍ය සංස්කෘතිය ය.

16. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. කැපකිරීම සහ දරා ගැනීම තුළින් සහජීවනය ළඟා කරගත හැකිය.
2. මාධ්‍ය ප්‍රචණ්ඩත්වය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ද හේතුවේ.
3. සහජීවනය බිඳ වැටුණු සමාජයක ළමා හා කාන්තා අයිතිවාසිකම්වලට හානි පැමිණේ.
4. ගෘහස්ථ හා සමාජීය ගැටලු ජන මාධ්‍ය තුළින් ප්‍රති නිර්මාණය වීම සහජීවනය රැක ගැනීමට උපකාරී වේ.
5. සන්නිවේදනය සඳහා පොදු භාෂාවක් තිබීම ද සහජීවනයට හේතුවකි.

17. පුද්ගලයා තුළ ප්‍රචණ්ඩත්වය රස විඳීමේ මානසිකත්වයක් ඇති වන්නේ,
A - ප්‍රචණ්ඩත්වයේ ඇති ආකර්ෂණීය බව නිසාය.
B - ප්‍රචණ්ඩත්වයේ සැඟවී ඇති ව්‍යාපාරික අරමුණු තේරුම් ගත නොහැකි නිසාය.
C - ග්‍රාහකයා තුළ විශ්ලේෂණාත්මක මෙන්ම උසස් වින්දනීය හැකියාවන් අවම නිසාය.
D - ප්‍රචණ්ඩත්වය ගැටුම් නිරාකරණයේ පිළියමක් නිසාය.
E - ප්‍රචණ්ඩත්වය මාධ්‍යයෙන් ප්‍රතික්ෂේප කිරීමෙන් ඇතිවන කුතුහලය නිසා ය.
ඉහත ප්‍රකාශ අතුරින්,
1. A හා B පමණක් සත්‍ය වේ. 2. A, B හා C පමණක් සත්‍ය වේ.
3. A, B හා E පමණක් සත්‍ය වේ. 4. A, B, C, D හා E සියල්ල සත්‍ය වේ.
5. ඉහත කිසිවක් සත්‍ය නොවේ.

18. සෑම සිංහල අලුත් අවුරුදු දිනයකම ගනුදෙනු කිරීමේ නැකතට තම පියා සමඟ ගනුදෙණු කරන චන්දන මෙවර ජනමාධ්‍ය තුළින් ප්‍රචාරය කළ ආකාරයට ගනුදෙනු කිරීම සඳහා ජනප්‍රිය බැංකුවක් තෝරාගත්තේ ය. මෙයින් පැහැදිලි වන්නේ,
1. මාධ්‍ය සංස්කෘතිය, සාම්ප්‍රදායික සංස්කෘතියේ සබඳතා උපක්‍රමශීලීව බිඳ හෙලන බවයි.
2. මාධ්‍ය සංස්කෘතිය විසින් සමාජයේ අනවශ්‍ය චාරිත්‍ර පිළිබඳව නවීන දැනුවත් භාවයක් ඇතිකරන බවයි.
3. පෞද්ගලික ආයතනවල මහජන සම්බන්ධතා ප්‍රවර්ධන උපක්‍රමවල සාර්ථක භාවයයි.
4. නව සමාජ සංස්කෘතියක අවශ්‍යතාවයක් පැරණි චාරිත්‍ර යල් පැන ගොස් ඇති බවත් සමාජය විසින් තේරුම්ගෙන ඇති බවයි.
5. සංවර්ධනය සඳහා දේශීය සංස්කෘතිය, මාධ්‍ය සංස්කෘතියට පරිවර්තනය කළ යුතු බවයි.

19. මෙහි සඳහන් සංවර්ධන සන්නිවේදන රූප සටහනෙන් දැක්වෙන්නේ,



1. රජය විසින් මහජනයාට සහනාධාර ලබාදෙන ආකාරයයි.
2. රජය විසින් ප්‍රාදේශීය මට්ටමෙන් ජනතාවගෙන් බදු අයකරගන්නා ආකාරයයි.
3. සංවර්ධන ව්‍යාපෘතිවලට කුඩා කණ්ඩායම් ලෙස එකතුවන ජනතාව අවසානයේ රජය සමඟ බැඳී දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක කොටස්කරුවන් වන බවයි.
4. ජාතික සංවර්ධනයට දේශිය හා විදේශීය ආයෝජන වලින් මුදල් ලබා ගන්නා ආකාරයයි.
5. දැවැන්ත ජාතික සංවර්ධන වැඩසටහන් රජය විසින් ප්‍රධාන නගරවල ව්‍යාප්ත කරන ආකාරයයි.

20. නිර්මාණාත්මක සන්නිවේදනයේ දී නිර්මාණකරුවකුට ඔහුටම ආවේණික අනන්‍යතාවයක් පවත්වාගත හැක්කේ ප්‍රධාන වශයෙන්,
1. ඔහු තුළ ඇති අනුකරණය හා සාක්ෂරතා හැකියාව මතය.
2. ග්‍රාහක සංජානනය හා නිර්මාණකරුගේ අනුකරණය මතය.
3. ඔහු අයත් සංස්කෘතියේ බලපෑම සහ ඔහු සතු ආර්ථික ශක්තියේ ප්‍රමාණාත්මක බව මතය.
4. නිර්මාණකරු සතු ප්‍රතිභාව, පරිකල්පන ශක්තිය සහ සමස්ත සමාජය කෙරෙහි පවත්නා වූ මානව දයාව මතය.
5. ග්‍රාහක ස්වරූපය සහ ග්‍රාහක මනස කෙතෙක් දුරට උද්දීපනය කරන්නේ ද ? යන කරුණ මතය.

21. ''මුළු මානව සංහතියම ඒකීය සමස්ත රාජ්‍යයක් බවට පත් වෙමින් ඇත.'' ගෝලීයකරණය පිළිබඳ මෙම අදහසට නොගැලපෙන වගන්තිය වන්නේ,
   1. සංවෘත රාජ්‍යයන්හි සංවෘතභාවය කෙළවර වෙමින් පවතින බවයි.
   2. ගෝලීයකරණය ජාතික රාජ්‍යයන්ට අභියෝගයක් නොවන බවයි.
   3. ජාතික රාජ්‍යවල ස්වාධීන අනන්‍යතාවය ක්‍රමයෙන් නැති වී යමින් පවතින බවයි.
   4. මුළු මහත් මානව සමාජය තුළම ඒ ඒ සංස්කෘතීන් හී අනන්‍යතාව ගිලිහී යමින් පවතින බවයි.
   5. නිර්බහුජනීය විඥාපන ප්‍රාග්ධනය ඒකාධිකාරයක් බවට පත්වෙමින් ඇති බවයි.

22. පහත සඳහන් අවස්ථාවලින් ජනමාධ්‍යයෙන් ලැබිය හැකි අධ්‍යාපන ස්වරූපවල අනුපිළිවෙල තෝරන්න.
   A - පොහොය දින ධර්ම දේශනාවකින්, පස් පව් වලින් වැලකෙන ආකාරය පහදා දීම.
   B - කල්ගිය, සුව කිරීමට අපහසු විවිධ රෝග සඳහා ප්‍රතිකාර ගත හැකි වෙද ගෙදරක් පිළිබඳ වැඩසටහනක් ප්‍රචාරය වීම.
   C - හාස්‍යජනක රූපවාහිනී වැඩසටහනක් ප්‍රචාරය වීම.

   1. මෙහෙයුම් සංදේශ, නඩත්තු සංදේශ, ශක්තිජනක සංදේශ
   2. ශක්තිජනක සංදේශ, මෙහෙයුම් සංදේශ, නඩත්තු සංදේශ
   3. විවෘත සංදේශ, නඩත්තු සංදේශ, ශක්තිජනක සංදේශ
   4. යථාර්ථවාදී සංදේශ, නඩත්තු සංදේශ, යථාකාරී සංදේශ
   5. විවෘත සංදේශ, නඩත්තු සංදේශ, ජනප්‍රිය සංදේශ

23. ජය - ජය මාදිලියට වඩාත් ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
   1. ''ඉඩි අමීන්'' පරාජය කර උගන්ඩාවේ පාලන බලය ''යුවේනි මුසාවෙන්'' අත්පත් කර ගත්තේය.
   2. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පැවති එක් දින ජාත්‍යන්තර ක්‍රිකට් තරගය වර්ෂාව නිසා ජය පරාජයෙන් තොරව නිමාවිය.
   3. චීනය හා ඉන්දියාව අතර පැවති ගැටුම, විවිධ එකඟවීම් සහ කැපකිරීම් හා භාර ගැනීම් සහිත සාම ගිවිසුමකින් නිමාවට පත්විය.
   4. අල්ලස් හා දූෂණ, වංචා සම්බන්ධයෙන් වැරදිකරුවකු වූ දේශපාලඥයා රටින් පැන ගියේ ය.
   5. පාරම්පරික ඉඩමකට වසර ගණනාවක් තිස්සේ සොහොයුරන් දෙදෙනකු නඩුකී අතර, අවසානයේ ඉඩම රාජසන්තක විය.

24. ව්‍යාපාරික අනුග්‍රහයෙන් තොරව මාධ්‍යයට ස්වාධීනව කටයුතු කළ නොහැකි බව දක්වන්නේ,
   1. මාධ්‍ය තුළ සිදුවන සියළු ප්‍රකාශන සඳහා ව්‍යාපාරික ප්‍රජාව විසින් අවකාශය මිලදී ගෙන සිටින නිසා ය.
   2. ව්‍යාපාරික මැදිහත්වීම සමාජීය අවශ්‍යතාවයක් නිසා ය.
   3. ව්‍යාපාරික මැදිහත්වීම ඉතා ආකර්ෂණීය හා සුමට භාවයකින් යුක්ත නිසා ය.
   4. ව්‍යාපාරික අනුග්‍රහයෙන් බැහැරව මාධ්‍යකරුවන්ට සිය නිර්මාණ ගොඩනැගිය නොහැකි නිසා ය.
   5. වෙළෙඳපොළ ව්‍යාප්තියට මාධ්‍යයේ සහයක් , මාධ්‍යයේ පැවැත්මට හා ව්‍යාප්තියට ව්‍යාපාරික ප්‍රජාවගේ සහයත් අවශ්‍ය නිසා ය.

25. රූපවාහිනී නාලිකාවක මාධ්‍ය සාකච්ඡාවක් මඟින් ධනය බෙදීයාමේ විෂමතාව ඒකාධිපති පාලනය සහ බලයට ඇති කෑදරකම පිළිබඳ කරුණු ඇතුලත් ටෙලි නාට්‍යයක් විවරණය කරන ලදී. මෙම සාකච්ඡාව සඳහා වඩාත් සුදුසු මාධ්‍ය විචාර ප්‍රවේශය වන්නේ,
   1. ඓතිහාසික ප්‍රවේශය. 2. සදාචාරාත්මක ප්‍රවේශය. 3. සෞන්දර්යාත්මක ප්‍රවේශය.
   4. දේශපාලනික ප්‍රවේශය. 5. සංසන්දනය හා විශ්ලේෂණ ප්‍රවේශය.

26. මනස පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. මනස නිරවුල් ක්‍රියාවලියකින් තොරය.
   2. පුද්ගලයාගේ යටි සිතෙහි ඇත්තේ උත්තරීතර පරමාදර්ශයන්ය.
   3. චර්යාව මානසික ක්‍රියාවලියට බලපායි.
   4. මනස යනු ශාරීරික පද්ධතිය විසින් බිහි කරන ශක්තියකි.
   5. ස්නායු පද්ධතිය හා මනස අතර සම්බන්ධයක් නැත.

27. සාමාජීය වශයෙන් වඩාත් ඵලදායී මාධ්‍ය සංස්කෘතික බලපෑමක් වන්නේ,
   1. සංස්කෘතික කම්පනයයි. 2. සංස්කෘතික හුවමාරුවයි. 3. සංස්කෘතික ආක්‍රමණයයි.
   4. සංස්කෘතික විසරණයයි. 5. සංස්කෘතික රාශිකෘතියයි.

28. සාම්ප්‍රදායික සංවර්ධන සන්නිවේදන මාධ්‍යයන් අයත් කාණ්ඩය වනුයේ,
    1. ජන ගායනා, ජන ඇදහිලි හා ජන වන්දනා ක්‍රම.
    2. ගැමි නාටක, රූකඩ, ටෙලි නාට්‍ය
    3. නාඩගම්, නූර්ති, නව නාට්‍ය
    4. පෝස්ටර්, අත්පත්‍රිකා, පුවත්පත්
    5. සඟරා, සම්මන්ත්‍රණ, ප්‍රචාරක පුවරු

29. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    1. වානිජ සංවිධානයක මහජන කණ්ඩායමකට පාරිභෝගිකයෝ මෙන්ම උපදේශකයෝද අයත් වෙති.
    2. භාණ්ඩ අලෙවිකරණ ප්‍රවර්ධන උපක්‍රමයක් ලෙස මහජන සම්බන්ධතා යොදාගත හැකිය.
    3. මහජන සම්බන්ධතාව අලෙවිකරණයේ අංගයක් ලෙසද භාවිත වේ.
    4. රූපවාහිනියේ ඕනෑම වැඩසටහනක් අතරතුර මහජන සම්බන්ධතා ප්‍රවර්ධන වැඩසටහන් ද යොදාගත හැකිය.
    5. පවුල සහ පාසල යන ඒකක වලට මහජන සම්බන්ධතා අවශ්‍ය නොවේ.

30. කෙනෙකුගේ චිත්ත ස්වභාවයෙහි අභ්‍යන්තරය වටහා ගැනීමට බොහෝවිට හැකි වන්නේ,
    1. සහානුභූතියෙනි.
    2. ආචාරශීලීත්වයෙනි.
    3. මෝහනය කිරීම තුළිනි.
    4. දැඩි ලෙස මිතුරු වීමෙනි.
    5. තදාත්මීකරණය තුලිනි.

31. සංස්කෘතික කම්පනයේ ලක්ෂණයක් නොවන්නේ,
    1. එය ගැටුම්කාරී ස්වභාවයකින් ප්‍රකාශ කළ හැකි වීමයි.
    2. වැඩිහිටි - තරුණ අරගලයක් ලෙස ද නිරූපණය වීමයි.
    3. සංස්කෘතියේ ස්ථාවර භාවය නිසා ඇතිවීමයි.
    4. විරෝධී සංස්කෘතික ක්‍රියාකාරකම් තුළින්ද ඉස්මතු වීමයි.
    5. සමාජයේ එක් කොටසක් නව සංස්කෘතිකාංග භාර ගැනීම සහ තවත් කොටසක් විසින් ඒවා ප්‍රතික්ෂේප කිරීමෙන් ඇතිවන තත්ත්වයයි.

32. ද්විත්ව රූපයක් සහිත සන්නිවේදන මෙවළමකි.
    1. ගුවන් විදුලිය
    2 භාෂාව
    3. රූපවාහිනිය
    4. ලේඛනය
    5. නව මාධ්‍ය

33. ස්වභාවිත ක්‍රියාවලියකට වඩා සැලසුම් කරන ලද ක්‍රියාවලියක් ලෙස දක්නට ලැබෙන්නේ,
    1. ගෝලීයකරණ ක්‍රියාවලිය යි.
    2 මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තිය හා සංසරණයයි.
    3. දැනුම් සමාජයේ ව්‍යාප්තියයි.
    4. සංස්කෘතික හුවමාරුවයි.
    5. සංස්කෘතික ත්වරණයයි.

34. සන්නිවේදන කාර්යයන් ඇතුලත් නිවැරදි කාණ්ඩය වනුයේ,
    1. තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය, මාධ්‍ය සාක්ෂරතාව
    2. අධ්‍යාපනය, පෙළඹවීම, සංජානනය
    3. මතවාදී කාර්යය, පෙළඹවීම, සංකල්ප විනිශ්චය
    4. සමාජානුයෝජනය, මාධ්‍ය විචාරය, සමාජ සංවිධානමය කාර්යය
    5. තොරතුරු සම්පාදනය, විනෝදාස්වාද සම්පාදනය, පෙළඹවීම.

35. විකල්ප හා විරෝධාකල්ප මාධ්‍යවල හඳුනාගත නොහැකි ලක්ෂණයක් වනුයේ,
    1. විශාල ආයතනික, සංවිධානගත ව්‍යුහයක් දක්නට නොලැබීම.
    2. මතවාදි කාර්යයන් වෙනුවෙන් පවත්වාගෙන යාම.
    3. ග්‍රාහක කණ්ඩායම කුඩා වුවත් ඉන් සමාජයට බලපෑමක් ඇති වීම.
    4. ජන විඥානයෙහි වෙනසක් ඇති කිරීමට කටයුතු නොකිරීම.
    5. සාම්ප්‍රදායික හා බලවත් ආයතනවලට එරෙහිව ක්‍රියාත්මක වීම.

36. ජනප්‍රිය සංස්කෘතියේ අංග අතරට අයත් නොවන්නේ,
    1. ආහාරපාන
    2. ඇඳුම් පැළඳුම්
    3. දෛනික ජීවිතය
    4. සංගීතය
    5. යාන වාහන

37. සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියක ඇගයුම් ක්‍රියාවලිය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    1. ව්‍යාපෘති යෝජනාවලිය තුළ ඇගයුම් ක්‍රියාවලිය පිළිබඳව ද ඇතුලත්ව තිබීම වැදගත්ය.
    2. ඇගයුම් ක්‍රියාවලිය සමස්ත ව්‍යාපෘති කාලසීමාව තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වේ.
    3. ඇගයුම් ක්‍රියාවලිය සඳහා ලිඛිත ලේඛන හා සටහන් අවශ්‍ය නැත.
    4. ඇගයුම තුළ සංශෝධන ද ඇතුලත් කළ හැකිය.
    5. ඇගයුම් ක්‍රියාවලිය සඳහා අභ්‍යන්තර මෙන්ම බාහිර පාර්ශව ද සම්බන්ධ කරගැනීම වැදගත් ය.

- **අංක 38 සිට 42 දක්වා, ප්‍රශ්න සඳහා පහත කරුණු පදනම් වේ.**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| A | - | වගකීම හා වගවීම | B | - | විසම්මුතිය හා එකඟත්වය | C | - | සහානුභූතිය |
| D | - | ආචාරශීලිත්වය | E | - | ඵලදායී කථනය | F | - | සිත හසුරුවා ගැනීම |
| G | - | සම්මුඛ සාකච්ඡා | H | - | ඉගෙනීම | | | |

38. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදන නිපුණතා පමණක් අයත් කාණ්ඩය වනුයේ,
1. H, F 2. A, C 3. D, F 4. H, G 5. B, E

39. ආවේගශීලි අවස්ථාවකදී අභියෝගයක් වන්නේ,
1. D 2. F 3. G 4. H 5. B

40. සාහිත්‍ය හා කලාත්මක නිර්මාණාත්මක කෘතීන් පරිශීලනයෙන් වැඩි දියුණු කරගත හැක්කේත් , අන්‍යයන්ගේ දුක සැප තේරුම් ගැනීමට උපකාරී වන්නේ,
1. A 2. D 3. C 4. F 5. E

41. සමස්ත සමාජයේ සංවර බව හා අඛණ්ඩ ස්ථිරසාර යහ පැවැත්මක් සඳහා උපකාරී වනුයේ,
1. A 2. B 3. C 4. D 5. H

42. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක දැකිය හැකි ලක්ෂණයකි.
1. F 2. H 3. E 4. A 5. B

43. නව මාධ්‍ය සඳහා භාවිතා කරන භාෂාවෙහි විශේෂ ලක්ෂණයක් වන්නේ,
1. කෙටි පද, යෙදුම් හා සංකේත භාවිතයයි.
2. පරිකල්පනය ඇතිකරන භාෂාවක් වීමයි.
3. ඉතා ඉක්මනින් ග්‍රහණය වන, දැඩිව දැනෙන භාෂාවක් වීමයි.
4. සංවේදී වචන යොදා ගැනීමයි.
5. ජාත්‍යන්තර භාෂා පමණක් යොදා ගැනීමයි.

44. සන්නිවේදන නියාමනයන් සමාජයට අත්‍යවශ්‍ය වේ. නියාමනය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. සන්නිවේදනයේ සාමාජීය පරමාර්ථ මුදුන්පත් කර ගැනීම නියාමනයේ පරමාර්ථයයි.
2. විවිධ නියාමනයන් සමාජය කෙරෙහි ඇති කරන්නේ අල්ප වූ බලපෑමකි.
3. සාම්ප්‍රදායක චර්යාවන් තුළ නියාමනය ප්‍රබලව ක්‍රියාත්මක වේ.
4. සන්නිවේදනයේ වාණිජ පරමාර්ථ හා සමාජීය පරමාර්ථ අතර පරතරයක් නැත.
5. පාසල නියාමන ආයතනයක් නොවේ.

45. මකරා, බෝදිලිමා, ඇත්කඳ ලිහිනියා වැනි මිත්‍යා චරිත දක්නට ලැබෙන්නේ,
1. ජන කවි තුළ ය. 2. යාතුකර්ම තුළය. 3. ජන කථා කලාව තුළය.
4. ජන ක්‍රීඩා තුළය. 5. විදේශීය ජනශ්‍රැති තුළය.

46. ප්‍රතිකාර කිරීමේ සංස්කෘතියක් දක්නට ලැබෙනුයේ,
1. යාතුකර්ම හා ශාන්තිකර්ම තුළය. 2. ජන වෙදකම තුළය.
3. ජන ආගම් තුළය. 4. ජන ඇදහිලි තුළය.
5. ජන වන්දනා ක්‍රම තුළය.

47. අනුග්‍රාහකත්වය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. ඉහල මට්ටමේ ජනතා ප්‍රසාදයක් අනුග්‍රාහකත්වය තුළින් ලබාගත හැකිය.
2. ශ්‍රී ලංකාව තුළ මත්පැන්, මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිෂ්පාදකයින්ට අනුග්‍රාහකත්වය දැක්විය නොහැකිය.
3. අනුග්‍රාහකත්වය සඳහා ව්‍යාපාරික ආයතන කොන්දේසි සීමා ආදී කිසිවක් ඉදිරිපත් නොකරයි.
4. විවිධ සමාජ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම අනුග්‍රාහකත්වයයි.
5. කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ව්‍යාපෘති සඳහා අනුග්‍රාහකත්වය දැක්විය හැකිය.

48. සමාජය, සමාජගත සබඳතා, සමාජ සම්මතයන් මෙන්ම විය යුතු හා නොවිය යුතු දෑ ආදී මතවාද සහිත කථා පුවතක් ඇතුලත් චිත්‍රපටයක් විචාරය සඳහා වඩාත් සුදුසු ප්‍රවේශය වන්නේ,
    1. දේශපාලනික ප්‍රවේශයයි. 2. සදාචාරාත්මක ප්‍රවේශයයි. 3. ඓතිහාසික ප්‍රවේශයයි.
    4. සෞන්දාර්යාත්මක ප්‍රවේශයයි. 5. භාෂාත්මක ප්‍රවේශයයි.

49. යම් පරිසරයක ව්‍යුහමය ගැටුම් යනු,
    1. සමාජයේ පුද්ගලයන්ගේ උස් පහත් බව නිසා ඇතිවන ගැටුම් ය.
    2. ආයතනික ධූරාවලිය පිළි නොගැනීම නිසා ඇතිවන ගැටුම් ය.
    3. පුද්ගලයන් හෝ ඔවුන් කටයුතු කරන ආයතනික පරිසරයේ ව්‍යුහයේ ඇති දෝෂ නිසා ඇතිවන ගැටුම් ය.
    4. යම් පාර්ශවයක් වෙත නිසි තොරතුරු නොලැබීයාම නිසා ඇතිවන ගැටුම් ය.
    5. මූලික මිනිස් අවශ්‍යතා සපුරාගත නොහැකි වූ විට ඇතිවන ගැටුම් ය.

50. සන්නිවේදනයේ ප්‍රධාන අරමුණ විය යුත්තේ,
    1. තොරතුරු සම්පාදනයයි.
    2. සමාජ සංවර්ධනයයි.
    3. දැනුම් සමාජය කරා මෙහෙයවීමයි.
    4. සමාජ සංහිඳියාව ඇති කිරීමයි.
    5. සමස්ත සමාජයේ යහ පැවැත්මයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 29 | S | II |
|---|---|---|

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 13 - 2019

විභාග අංකය ............................ **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II** කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) සංවර්ධනය පිළිබඳ මහාචාර්ය විමල් දිසානායකගේ අර්ථකථනය දක්වන්න. (ල. 2)

(ii) උප සංස්කෘතියක් යනු කුමක්දැයි අර්ථකථනය කර ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) ''මාධ්‍ය සංස්කෘතියේ සාමාජීය බලපෑම තුන් ආකාරය'' උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 6)

(iv) ආයතනයක මහජන සම්බන්ධතා ප්‍රවර්ධනයේ දී පාරිසරික මෙවලම් භාවිතය පිළිබඳව උදාහරණ 04 ක් දක්වා, ඒ පිළිබඳව විස්තර කරන්න. (ල. 8)

02. (i) නිර්මාණාත්මක සන්නිවේදනයේ දි මූලාශ්‍ර අධ්‍යයනය වැදගත්වීමට හේතු දෙකක් දක්වන්න. (ල. 2)

(ii) මාධ්‍ය විචාරකයා සතුවිය යුතු ලක්ෂණ 04 ක් දක්වන්න. (ල. 4)

(iii) ගැටුම් කළමණාකරණය යනු කුමක්දැයි කරුණු 3ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ගෘහස්ථ සාමය හා සහජීවනය කළමණාකරණය සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් දක්වා ඒ පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 8)

03. (i) මාධ්‍ය සාක්ෂරතාවයට අදාළ කුසලතා 04 ක් දක්වන්න. (ල. 2)

(ii) ග්‍රාමීය පරිසරයේ සංවර්ධන ව්‍යාපෘතියකට යොදාගත හැකි සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම 04 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) ජනප්‍රිය සංස්කෘතිය අර්ථකථනය කර එහි ස්වරූපය කරුණු 3ක් මඟින් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) මාධ්‍ය සංස්කෘතිය සමාජය වෙත බලපෑම් එල්ල කරන ස්වරූප 04 ක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 8)

04. (i) මාධ්‍ය අධ්‍යාපනය අර්ථකථනය කරන්න. (ල. 2)

(ii) ජනප්‍රිය සංස්කෘතියේ පාර්ශවකරුවන් නම් කර ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය හේතුකොටගෙන පුද්ගල හා සමාජීය න්‍යාය පත්‍ර වෙනස්වන ආකාරය කරුණු 3 ක් මඟින් උදාහරණ සහිතව විග්‍රහ කරන්න. (ල. 6)

(iv) ''මානව සන්නිවේදනයේ ඓතිහාසික විකාශනය, වර්තමානය හා අනාගතය'' මැයෙන් පාසල් මාධ්‍ය සඟරාවට සුදුසු වචන 250 කට නොඅඩු ලිපියක් සකස් කරන්න. (ල. 8)

05. (i) සාමූහික වැඩ, වගකීම හා වගවීම අර්ථකථනය කරන්න. (ල. 2)

(ii) සමාජ සංයුතියේ අන්තර්ගතයන් 04 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) පෞද්ගලික ආයතනයක නිෂ්පාදනයක් පිළිබඳ සමාජය තුළ යම් නොසන්සුන්කාරී වාතාවරණයක් ඇති වී ඇති අවස්ථාවක මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමේ වගකීම මහජන සම්බන්ධතා නිලධාරියා ලෙස ඔබ වෙත පැවරී ඇත. එහි දී සැලකිලිමත් විය යුතු කරුණු 3ක් පිළිබඳව විස්තර කරන්න. (ල. 6)

(iv) එදිනෙදා ජීවිතයේ දී ඇතිවිය හැකි සරල මානසික පීඩා 04 ක් නම් කර, ඒවාට මුහුණ දීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව උදාහරණ සහිතව විග්‍රහ කරන්න. (ල. 8)

06. (i) සමථකරණයේ ප්‍රතිලාභ හතරක් දක්වන්න. (ල. 2)

(ii) පුරවැසිභාවය හා මෙහෙවර අර්ථකථනය කරන්න. (ල. 4)

(iii) මාධ්‍ය විචාරයේ සාමාජීය අවශ්‍යතාව කරුණු 3ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ඔබ දන්නා මාධ්‍ය විචාර ප්‍රවේශයන් හතරක් නම් කර, ඔබ මෑතකදී රස විදි යම් නිර්මාණයක් පිළිබඳ ඉහත ප්‍රවේශයක් ඇසුරින් විචාරයකට ලක්කරන්න. (ල. 8)

07. (i) ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය පිළිබඳ අර්ථකථනයක් ඉදිරිපත් කරන්න. (ල. 2)

(ii) ජන මාධ්‍ය භාෂා භාවිතයේ ප්‍රබලතා දෙකක් සහ සීමා දෙකක් දක්වන්න. (ල. 4)

(iii) විද්‍යුත් මාධ්‍ය ගෘහස්ථ ආක්‍රමණය සිදුවන ආකාරය කරුණු 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) සංවර්ධන සන්නිවේදන සංදේශකරණයේදී ග්‍රාහක ප්‍රජාව වර්ගීකරණය වන ආකාරය දක්වා ග්‍රාමීය සාම්ප්‍රදායික සමාජය තුළ එබඳු ග්‍රාහක විවිධත්වයක් සඳහා සංවර්ධන සංදේශ සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් පිළිබඳ විස්තර කරන්න. (ල. 8)

# තෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I කොටස

### පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. - 4 | 11. - 1 | 21. - 2 | 31. - 3 | 41. - 4 |
| 02. - 4 | 12. - 3 | 22. - 1 | 32. - 2 | 42. - 5 |
| 03. - 5 | 13. - 2 | 23. - 3 | 33. - 2 | 43. - 1 |
| 04. - 1 | 14. - 4 | 24. - 5 | 34. - 5 | 44. - 1 |
| 05. - 3 | 15. - 5 | 25. - 4 | 35. - 4 | 45. - 3 |
| 06. - 3 | 16. - 4 | 26. - 4 | 36. - 3 | 46. - 2 |
| 07. - 2 | 17. - 2 | 27. - 2 | 37. - 3 | 47. - 3 |
| 08. - 3 | 18. - 1 | 28. - 1 | 38. - 1 | 48. - 2 |
| 09. - 4 | 19. - 3 | 29. - 5 | 39. - 2 | 49. - 3 |
| 10. - 5 | 20. - 4 | 30. - 1 | 40. - 3 | 50. - 5 |

## II කොටස

### පිළිතුරු

01. (i) ජාතික සංවර්ධනය යනු ප්‍රධාන වශයෙන් ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය හා සදාචාරාත්මක සංවර්ධනය යන කොටස් වලින් පරිපූර්ණ සංවර්ධනයයි. - **මහාචාර්ය විමල් දිසානායක** -
(ල. 2)

(ii) විවිධ සාධක මත වෙන්ව පවතින උප සමාජයකට අයත් සංස්කෘතිය උප සංස්කෘතියකි.
(කෙටි පැහැදිලි කිරීමක් අවශ්‍ය ය.) (ල. 4)

(iii) සංස්කෘතික කම්පනය, සංස්කෘතික ආක්‍රමණය හා සංස්කෘතික හුවමාරුව පිළිබඳව උදාහරණ සහිතව විස්තර කර තිබීම අවශ්‍ය ය. (ල. 6)

(iv) * වර්ණ ආලේපය * මාලු ටැංකි * ප්‍රියජනක වටපිටාව * වායු සමනය
* සුව පහසු ගෘහ භාණ්ඩ * කුඩා උද්‍යාන * රූපවාහිනි යන්ත්‍ර
ආදී වශයෙන් භාවිත මෙවලම් සහ ඒවා යොදාගෙන ඇති ආකාරය පිළිබඳ විස්තර කිරීම අවශ්‍යය.
(නම් කිරීම සඳහා ල. 2) (විස්තර කිරීම සඳහා ල. 6) (එකතුව = 8)

02. (i) 01. නිර්මාණාත්මක සන්නිවේදනය කෙසේ බිහිවී සංවර්ධනය වූයේ ද යන්න දැන ගැනීම සඳහා.
02. ඒ ඒ නිර්මාණයන් බිහිවීම, භාවිතය හා පැවැත්ම ද වෙනස්වීම්වලට භාජනය වීමද පිළිබඳව අධ්‍යයනය කිරීම.
03. ඒවා සමාජය සමඟ බැඳී ඇති ආකාරය පිළිබඳ හඳුනා ගැනීම ආදී වශයෙන් කරුණු 02 ක් දක්වා තිබීම. (ල. 2)

(ii) විෂය නිර්දේශයේ 12.1.4 කොටසට අදාලව කරුණු 04ක් දක්වා තිබීම. (ල. 4)

(iii) විෂය නිර්දේශයේ 9.1.3 කොටසට අදාලව කරුණු 03ක් දක්වා තිබීම. (ල. 6)

(iv) 1. ගෘහස්ත සාමය හා සහජීවනය කළමණාකරණය එහි සාමාජික සියල්ලන්ගේ වගකීමක් බව.
2. ගෘහයේ සාමාජිකයන් මානව ධර්මතාවලට එකඟ විය යුතු බව.
3. ප්‍රධාන වගකීම දෙමාපියන්ටත් අතුරු වගකීම් දරුවන්ටත් හිමිවන බව.
4. තම තමන්ගේ දෝෂ හඳුනාගෙන කටයුතු කල යුතු බව.
ආදී වශයෙන් විෂය නිර්දේශයට අනුව කරුණු දක්වා තිබීම හා විස්තර කර තිබීම අවශ්‍යය. (ල. 8)
(එකතුව = 20)

03. (i) * පරිහරණය කිරීමේ කුසලතාවය * විශ්ලේෂණය කිරීමේ කුසලතාවය
* ඇගයීමේ කුසලතාවය * නිර්මාණය කිරීමේ කුසලතාවය (ල. 2)

(ii) ජන නාට්‍ය, ජන ගී, ජන ක්‍රීඩා, ජන නැටුම්, ජන රංග කලා.... ආදී වශයෙන් ජනශ්‍රැති අංග 04ක් දක්වා තිබීම සහ එකක් කෙටියෙන් පැහැදිලි කර තිබීම. (ල. 4)

(iii) ජාතික හෝ අන්තර් ජාතික මට්ටමේ ව්‍යාපාරික අරමුණු සමඟ ඉදිරිපත් කරන භාණ්ඩ හා සේවා හා චර්යාවන් එක් වීමෙන් සෑදෙන සංස්කෘතිය ජනප්‍රිය සංස්කෘතියයි.
ස්වරූපය
* සෑම සමාජ පන්තියක්ම ආකර්ෂණය කර ගැනීම. * මහා පරිමාණ නිෂ්පාදනයක් ලෙස බෙදා හැරීම.
* වාණිජත්වය සමඟ බැඳී පැවතීම. * කල්පවත්නා ස්වභාවයක් නොමැති වීම.
ආදී කරුණු 3 ක් විස්තර කර තිබිය යුතුය. (ල. 6)

(iv) * චර්යා රටාවන් වෙනස් කිරීම. * ආකල්පමය වෙනස්කම් ඇති කිරීම.
* සම්මතයන් අභියෝගයට ලක් කිරීම. * අධි පරිභෝජනයට හුරු කිරීම.
* නව ප්‍රතිරූප නිර්මාණය * කෘත්‍රිම හා ව්‍යාපාර අවශ්‍යතා ඉස්මතු වීම ආදිය (ල. 8)

(එකතුව = 20)

04. (i) මාධ්‍ය අධ්‍යාපනය යනු මාධ්‍ය සංදේශයක් විචාරාත්මක ඇගයුමටත්, එහි බලපෑම විශ්ලේෂණය කිරීමටත්, නිර්මාණශීලීව මාධ්‍ය සංදේශයන් සැකසීමටත් අදාළව මාධ්‍ය සාක්ෂරතාව අත්පත් කර ගැනීම සඳහා වූ ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වේ. (ල. 2)

(ii) ව්‍යාපාරිකයන් ''බහුජන මාධ්‍ය හා පාරිභෝගික ජනයා පිළිබඳව කෙටියෙන් පැහැදිලි කර තිබීම අවශ්‍ය ය. (ල. 4)

(iii) විෂය නිර්දේශයේ 10, 2, 4 කොටස ඇසුරින් කරුණු විස්තර කර තිබීම අවශ්‍යය. (ල. 6)

(iv) විෂය නිර්දේශයේ 1.1.2 කොටස ඇසුරින් නිර්මාණාත්මක ලිපියක් සකස් කර තිබීම අවශ්‍යය. (ල. 8)

(එකතුව = 20)

05. (i) * සමූහයක් විසින් එක්ව කළයුතු වැඩ සාමූහික වැඩ ලෙස හැඳින්වේ.
* සමූහයක් තුළ තමාවෙත පැවරුණු හා තමන් විසින් ඉටුකළ යුතු වැඩ කටයුතු වගකීම වේ.
* සමූහයක් තුළ පුද්ගලයා වෙත නොපැවරුණු එහෙත් අන් අය වෙත පැවරුණු වැඩ කටයුතු පිළිබඳවද සොයා බලා ඒ පිළිබඳ හැඟීමක් ඇති කර ගැනීම වගවීම වේ. (ල. 2)

(ii) * න්‍යෂ්ටික හා විස්තෘත පවුල * වාත්තු කරන ලද සංවිධාන
* ප්‍රජා මූල හා ව්‍යාපාර මූල සංවිධාන * බල කණ්ඩායම්
* සාමාජීය සංවිධානයක් * පන්ති ක්‍රමය
* කුළ ක්‍රමය .... ආදි වශයෙන් 04 ක් දක්වා තිබීම සහ එකක් කෙටියෙන් පැහැදිලි කර තිබීම අවශ්‍ය වේ. (ල. 4)

(iii) විෂය නිර්දේශයේ 5.3.3 කොටස ඇසුරින් කරුණු පැහැදිලි කර තිබීම අවශ්‍ය වේ. (ල. 6)

(iv) ආතතිය, ක්ලමථය, කාංසාව හා විශාදය යන සරල මානසික පීඩා විස්තර කර තිබීම සහ ඊට මුහුණ දීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රමාණවත් උදාහරණ දක්වා තිබීම අවශ්‍ය වේ.

**නම් කිරීම** - 02
**විස්තර කිරීම** - 02
**ක්‍රියාමාර්ග** - 04
**ල.** 08

(එකතුව = 20)

06. (i) * කාලය ඉතුරු වීම (දින 60 ක දී ආරවුල් නිරාකරණය)
* මුදල් ඉතිරිවීම. (රු. 5ක මුද්දරයක් පමණ)
* නීතිඥයින් අනවශ්‍ය වීම.
* පාර්ශවකරුවන්ගේ හා සාක්ෂිකරුවන්ගේ රහස්‍යභාවය සුරැකීම.
* සබඳතා බිඳවැටීම නොව සබඳතා ගොඩ නැඟීමට උදව් වීම. (ල. 2)

(ii) * භූගෝලීය හා දේශපාලනමය වශයෙන් ස්වාධීන වූ පරිසරයක පුද්ගලයාට ජීවත්වීමට ඇති අයිතිය පුරවැසි භාවය ලෙසද, තමා ජීවත්වන සමාජය ආරක්ෂා කිරීමත් එහි අභිවෘද්ධිය සඳහා කැපවීමත් සෑම පුරවැසියෙකුගේම සමාජීය මෙහෙවරට අයත් බව ලෙස දක්වා තිබීම. (ල. 2)

(iii) විෂය නිර්දේශයේ 12.1.2. කොටස ඇසුරින් කරුණු සපයා තිබීම අවශ්‍යය. (ල. 6)

(iv) * සංසන්දනය හා විශ්ලේෂණ ප්‍රවේශය. * සෞන්දර්යාත්මක ප්‍රවේශය.
* භාෂාත්මක ප්‍රවේශය. * සදාචාරාත්මක ප්‍රවේශය.
* දේශපාලනික ප්‍රවේශය. යන ප්‍රවේශ අතුරින් හතරක් විස්තර කර තිබිය යුතුය. (ල. 8)

(එකතුව = 20)

07. (i) මිනිසා පරිසරය හා ගැටෙමින් කාලාන්තරයක් ජීවත් වෙමින් ලබා ගන්නා ප්‍රායෝගික දැනුමෙන් තීන්දු තීරණ ගැනීමේ හා අනාවැකි පලකිරීමේ හැකියාව ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර් ඥානයයි. (ල. 2)

(ii) ප්‍රබලතා
1. කෙටි, සංක්ෂිප්ත, නිර්මාණශීලී භාෂා භාවිතය.
2. සිත් ගන්නා සුළු භාෂා භාවිතය.
3. සංවේදී භාෂා භාවිතය.
4. ග්‍රාහක අවධානය දිනාගත හැකි බව.

**සීමා**

1. පුවත්පතක ඉඩකඩ
2. ගුවන් විදුලි හා රූපවාහිනී ගුවන් කාලය
3. අනවශ්‍ය ලෙස භාෂා භාවිතය තුළ රූපයට හානි පැමිණීම.
4. ග්‍රාහක සීමා.
5. සදාචාරාත්මක හා සංස්කෘතික සීමා. (ල. 4)

(iii) විෂය නිර්දේශයේ 10.1.1 ඇසුරින් කරුණු දක්වා තිබීම අවශ්‍යය. (ල. 6)


(iv) A - ජන මත නායකයින්

B - ප්‍රමුඛ අනුගාමිකයින්

C - ප්‍රමුඛ බහුජනතාව

D - ප්‍රමාදිත බහුජනතාව

E - නවීකරණයට කෙසේවත් එකඟ නොවන පිරිස




ඉහත කණ්ඩායම් සඳහා සංදේශ නිර්මාණකරණයේදී සංවර්ධන සංදේශන මාධ්‍ය හඳුනාගැනීම, සංවර්ධන සංදේශ නිර්මාණය, සංවර්ධන සංදේශ ප්‍රවර්ධනය යනාදි කරුණු ඇසුරින් පිළිතුර ගොඩ නංවා තිබීම අවශ්‍ය. (ල. 8)

(එකතුව = 20)